# ඇබෑර්තු

IWWRMP

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

# ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

**අරමුදල් ප්‍රභවය : ලෝක බැංකුව**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) යනු ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

2026.03.28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 02/2026 සහ රජයේ බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව, පහත සඳහන් තනතුරු සඳහා පූර්ණ කාලීන කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | කාණ්ඩය | ඇබෑර්තු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සන්නිවේදන නිලධාරී | D (II) | 1 |
| 02 | ඉංජිනේරු (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පිළිබඳ පළපුරුද්දක් තිබීම වඩාත් සුදුසුයි) | D (II) | 2 |

ඉහත තනතුරුවල වැටුප්, සමස්ත ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 25 කට වඩා වැඩි ව්‍යාපාති සඳහා අදාළ වන පරිදි, MSD චක්‍රලේඛ අංක 02/2026 හි ඇමුණුම 02 හි 02 වන තීරුවේ දක්වා ඇත.

1 සහ 2 තනතුරු සඳහා මූලික සුදුසුකම් සහ පළපුරුද්ද (MSD චක්‍රලේඛ අංක 02/2026 ට අනුව)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ උපාධියකට සමාන සුදුසුකමක් සමග අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් සතු විය යුතු අතර, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.

හෝ

02. රජයේ දිප ව්‍යාප්ත සේවයේ II/III පන්තියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියක හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක සිටින, II/III පන්තියේ හෝ සමාන තත්ත්වයේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් ඇති නිලධාරියෙකු විය යුතුය.

**03. රියදුරු (ඇබෑර්තු සංඛ්‍යාව : 1)**

**වැටුප් :** MSD චක්‍රලේඛ අංක 02/2026 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ට අනුව හිමිවේ.

**සුදුසුකම් :**

අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල / දෙමළ භාෂාව ඇතුළුව විෂයන් හයකින් (06) වාර දෙකකට නොවැඩි ගණනකදී, අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව සමත්ව තිබිය යුතුය.

**පළපුරුද්ද :**

බර වාහන රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු, බර වාහන රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුද්දක් තිබිය යුතුය.

(පළපුරුද්ද සේවා සහතික මගින් තහවුරු කළ යුතුය)

**පොදු කොන්දේසි**

01. අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.
02. වැටුප 2026.03.28 දිනැති MSD චක්‍රලේඛ අංක 02/2026 සහ ඉන් අනතුරුව සිදු කරන ලද ඕනෑම සංශෝධනයකට අනුකූලව රජය විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් සහ දීමනා මත පදනම් වේ.
03. පත්වීම් මුලින් වසරක (01) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර, සතුටුදායක කාර්ය සාධනය සහ ව්‍යාපෘති අවශ්‍යතා මත පදනම්ව වාර්ෂිකව අලුත් කරනු ලැබේ.
04. තේරී පත්වන අපේක්ෂකයින්ට අදාළ රාජ්‍ය ආයතන සහ අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීමට සහ රාජකාරි ඉටු කිරීමට සිදු වේ.
05. ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන හෝ වෙනත් විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘතිවල ශ්‍රී ලංකාවේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
06. අපේක්ෂකයින් අවශ්‍ය අවස්ථාවලදී අතිරේක වේලාවන් සහ සති අන්තවල සේවය කිරීමට ඇති හැකියාව.
07. තම වෘත්තීය ජීවිතය පුරා උසස් නිලධාරීන් සමග යහපත් හැසිරීම හා වෘත්තීය සබඳතා පිළිබඳ සනාථ කළ වාර්තාවක් අවශ්‍යවේ.
08. තරුණ, උද්යෝගිමත් හා කඩිසර අයදුම්කරුවන් අයදුම් කිරීම සඳහා දිරි ගැන්වේ.

සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් (CV), ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකු සම්බන්ධ කර ගත හැකි තොරතුරු සහ අධ්‍යාපනික හා වෘත්තීය සහතිකවල සහතික කළ පිටපත් සමග අයදුම්පත්, 2026 ජූනි මස 09 වන දින හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සම්පූර්ණයෙන්ම රජයට අයත් සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

මීට අමතරව, අපේක්ෂකයින් එම අයදුම්පතේම පිටපතක් ao.iwwrmp@gmail.com වෙත විද්‍යුත් තැපෑලෙන් (Email) එවිය යුතු අතර, විද්‍යුත් තැපෑලෙන් විෂය තීරුවේ (Subject line) අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව සිදු කෙරෙන අතර, කෙටි ලැයිස්තුගත කරන ලද අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. කිසිම් හෝ ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර, එවැනි අපේක්ෂකයින්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP),**
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**නො. 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**
**දුරකථන : 0112691163**
**වෙබ් අඩවිය : www.iwwrmp.lk**